www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අප්‍රකට කන්ඩායමක් දෙමල මාධ්‍යවේදියාගේ ඝාතනය පිලිබඳ වගකීම බාර ගනී

## Obscure Sri Lankan group claims responsibility for Tamil journalist's murder

**අපේ වාර්තාකරුවකු විසිනි**
**2005 මැයි 25**

"ථෙරපුත්තාභය බලකාය" නමින් තමන්ව හඳුන්වා ගන්නා කලින් දැන නොසිටි කන්ඩායමක්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ දෙමල මාධ්‍යවේදියකු වූ ධර්මරත්නම් සිවරාම්ගේ මෑත ඝාතනය පිලිබඳ වගකීම බාර ගනිමින්, පසුගිය සතියේ "නිවේදනයක්" නිකුත් කලේ ය.

සිවරාම්, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට දේශපාලනිකව හිතවත් බවට ප්‍රසිද්ධ *ටැමිල්නෙට්* වෙබ් අඩවියේ ජ්‍යෙෂ්ඨ සංස්කාරකවරයෙක් විය. ඔහු අප්‍රේල් 28 දා කොලඹ දී පැහැර ගැනීමට ලක් වූ අතර එදින ම රාත්‍රියේ ඔහුගේ සිරුර අගනුවරට නුදුරු ස්ථානයක දමා ගොස් තිබුනි. ඔහුගේ මරනයෙන් සති තුනකට ආසන්න කාලයක් ගෙවී ගොස් ඇතත්, අපරාධකරුවන් පිලිබඳ මොන යම් හෝ හෝඩුවාවක් සොයා ගැනීමට පොලීසිය තවමත් සමත්ව නැත.

"මව්බිමට විනා කරන සියලු දෙනා නොපමාව මව්බිමට පොහොර වීමට සූදානමින් සිටිය යුතු" බවට ඉහත කන්ඩායමේ ලිපිය භයංකර අනතුරු ඇඟවීමක් කරයි.

ප්‍රසිද්ධ පුද්ගලයන් ගනනාවකට මෙම මරන තර්ජන ලැබී ඇත. ප්‍රසිද්ධ කලාකරුවකු වන ධර්මසිරි බන්ඩාරනායක, *රාවය* සහ *සන්ඩේ ලීඩර්* යන සිංහල හා ඉංග්‍රීසි පුවත්පත්වල කතුවරුන් වන වික්ටර් අයිවන් හා ලසන්ත වික්‍රමතුංග, මාධ්‍යවේදියකු වන සුනන්ද දේශප්‍රිය, නව සමසමාජ පක්ෂයේ (නසසප) නායක වික්‍රමබාහු කරුනාරත්න සහ සාම ක්‍රියාකාරිකයකු වන පාක්‍යසෝති සරවනමුත්තු යන අය ඔවුන්ට ඇතුලත් ය.

බන්ඩාරනායක සිංහල හා දෙමල කලාකරුවන් අතර ඒකාබද්ධ ක්‍රියාකාරකම් දිරිගැන්වීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ය. අනෙක් අය කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය අතර සාම සාකච්ඡා යලි ඇරඹීමේ ප්‍රයත්නයන්ට ප්‍රසිද්ධියේ සහයෝගය දක්වති. සෙසු සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් මෙන්, "ථෙරපුත්තාභය බලකාය" ද එල්ටීටීඊයට හා රටේ දෙමල සුලුතරයට දෙන ඕනෑම සහනයක් රාජද්‍රෝහි ක්‍රියාවකට සම යැයි සලකයි.

ලිපිය, විපක්ෂ එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ රටේ පාලක සභාගයේ ප්‍රධාන පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) "කොටස්", රට බෙදා එල්ටීටීඊයට වෙනම ඊලම් රාජ්‍යයක් ලබා දීමට කුමන්ත්‍රනය කරන "කොල කොටි" සහ "නිල් කොටි" ලෙස හංවඩු ගසා ඇත. ඊනියා සාම ක්‍රියාදාමයේ මැදිහත්කරුවන් ලෙස ක්‍රියා කොට ඇති නෝර්වේජියානු ආන්ඩුව "සුදු කොටි" ලෙස හෙලා දකිනු ලැබ ඇත.

සිවරාම් ඝාතනය වනාහි සිංහල දේශපාලන පක්ෂ හා කන්ඩායම් ගනනාවක් විසින් දෙමල විරෝධී වර්ගෝත්තමවාදය ඇවිස්සීම මගින් සමාජ ආතතීන් ඇවිලවීමට ගෙන යනු ලබන උද්ඝෝෂනයක කොටසකි. දශක දෙකක ව්‍යසනකාරී සිවිල් යුද්ධය, ශ්‍රී ලංකාවේ මිලිටරියේ ඉහල නිලධාරී පැලැන්තිය, රාජ්‍ය නිලධරය, ව්‍යාපාරික කොටස් සහ බෞද්ධ ධූරාවලිය තුල බලගතුව මුල් බැස ගත් වරප්‍රසාද නිර්මානය කර ඇත. එපමනක් නොව, සිංහල ස්වෝත්තමවාදය අවුලුවාලීම, රටේ තියුනු සමාජ ආතතීන් වෙතින් මහජන අවධානය අපසරනය කිරීමේ පහසු උපක්‍රමයකි.

"ථෙරපුත්තාභය බලකාය" යන නම යොදා ගෙන ඇත්තේ, පැරනි සිංහල රජවරුන් දිවයින තුල ආධිපත්‍යය දරූ මිථ්‍යාකරනයට ලක් කෙරුනු අතීතයක් මතකයට නංවාලනු පිනිස ය. ථෙරපුත්තාභය යනු, දෙමල රජ කෙනෙකු පරාජය කොට "රට එක්සත්" කල අයකු ලෙස සිංහල වර්ගෝත්තමවාදීන්ගේ ගෞරවයට ලක් වන දුටුගැමුනු නම් වූ පැරනි සිංහල රජු යටතේ සටන් කල කල්පිත රනකාමියෙකුගේ නමයි.

"ථෙරපුත්තාභය බලකාය" පිටුපසින් සිටින්නේ කවුරුන් ද යන වගත් නැත හොත් එය වෙනම සංවිධානයක් ලෙස පවතිනවාද යන වග පවා පැහැදිලි නැත. ශ්‍රී ලංකාවේ වෙරලබඩ ප්‍රදේශවල විශාල කොටසක් විනාශයට ලක් කල දෙසැම්බර් 25 සුනාමියෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම පිනිස ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවීම සඳහා එල්ටීටීඊය සමග එකඟතාවකට ඒමට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග දරන ප්‍රයත්නයන්ට එරෙහි උද්ඝෝෂනය තුල සංවිධාන ගනනාවක් ම ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටු කර ඇත.

පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) කොටස්කරුවකු වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), මොන යම් හෝ ඒකාබද්ධ යාන්ත්‍රනයක් පිහිටුවුව හොත් ආන්ඩුවෙන් ඉවත් වන බවට තර්ජනය කොට තිබේ. ජවිපෙ වාචාලයන් කියාපාන්නේ, එවන් එකඟතාවක් එල්ටීටීඊයට නිල පිලිගැනීමක් ප්‍රදානය කිරීමට සමාන වනවා මෙන් ම වෙනම දෙමල රාජ්‍යයක් දෙසට තැබෙන පියවරක් ද වනු ඇති බවයි. දේශපාලන ආධිපත්‍යය උදෙසා ජවිපෙ ජාතික හෙල උරුමය සමග තරග වැද සිටී.

සිවරාම් ඝාතනය හෝ "ථෙරපුත්තාභය බලකාය" සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන් ද යන්න පැහැදිලි නැති වුවත්, ජවිපෙ හා ජාතික හෙල උරුමය යන දෙපාර්ශ්වයට ම වර්ගවාදී ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වාර්තාවක් පවතී.

1987-1990 කාල පරිච්ඡේදය තුල දී, එවක තහනම් කෙරුනු පක්ෂයක් වූ ජවිපෙ, ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය නම් වූ පෙරමුනු සංවිධානයක් හරහා ෆැසිස්ට් ත්‍රස්ත ව්‍යාපාරයක් මුදා හැරියේ ය. එම ගිවිසුම වනාහි දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල ඉන්දියානු "සාම සාධක" හමුදාවක් යෙදවීම මගින් සිවිල් යුද්ධය නතර කිරීමට දැරුනු ප්‍රයත්නයකි.

ජවිපෙ උද්ඝෝෂනයට විරුද්ධ වූ අය "කොල කොටි" නැත හොත් ද්‍රෝහීන් ලෙස හෙලා දැකීමට ලක්ව දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ තුවක්කුකරුවන්ට ඉලක්ක විය. සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) සාමාජිකයන් තිදෙනෙක් ද එලෙස අමු අමුවේ මරා දැමුනු අය අතර විය. විකොස, ජවිපෙ ස්වෝත්තමවාදී උද්ඝෝෂනය හා ඉන්දු-ලංකා ගිවිසුම යන දෙකට ම විරුද්ධ වෙමින් ද කම්කරු පන්තිය සූරාකෑම උත්සන්න කිරීමේ එල්ලයෙන් යුතුව සැලසුම් කෙරුනු ගිවිසුමක් ලෙස එය එලිදරව් කරමින් ද ජාත්‍යන්තර සමාජවාදී මූලධර්ම ආරක්ෂා කලේ ය.

ජාතික හෙල උරුමය සහ එහි පූර්වගාමී සිහල උරුමය, 2003 හා 2004 වසරවල ක්‍රිස්තියානි පල්ලිවලට එල්ල වූ ප්‍රහාර ඇතුලු, විවිධාකාර වර්ගවාදී ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් චෝදනාවට ලක්ව ඇත. බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවනු ලබන ජාතික හෙල උරුමය, සිංහල බෞද්ධ ධර්ම රාජ්‍යයකට සම වන සිය ඉල්ලීම් යුක්තියුක්ත කරනු පිනිස මිථ්‍යාමය සිංහල ඉතිහාසයක් නිරන්තරයෙන් මතකයට නංවයි. මීට පෙර වතාවක දී, පක්ෂය සිය නායක එල්ලාවල මේධානන්ද අද කාලයේ "ථෙරපුත්තාභය" කෙනෙකු ලෙස පින්තාරු කොට ඇත. "ථෙරපුත්තාභය" යනු සිංහල රාජධානිය ආරක්ෂා කරනු පිනිස සිවුරු හැර රනකාමියකු බවට පත් වූ භික්ෂුවකි.

සිවරාම් ඝාතනයට පසුව, ජාතික හෙල උරුමය, මෑත ම "ථෙරපුත්තාභය බලකායේ" නිවේදනයේ පිලිවෙතට සම වන ආකාරයේ බියකරු අනතුරු ඇඟවීමක් නිකුත් කලේ ය. ඝාතනය සාදරයෙන් පිලිගනිමින් එම නිවේදනයෙන් ජාතික හෙල උරුමය මෙසේ සඳහන් කලේ ය: "ටැමිල්නෙට් සංස්කාරකගේ ඉරනම අනාගතයේ දී රටට එරෙහි වන සියල්ලන්ට ම අනතුරු අඟවන නිදසුනකි."

ජාතික හෙල උරුමයේ හා ජවිපෙ උද්ඝෝෂන නිකම්ම අහසින් කඩා පාත් වූ ඒවා නො වේ. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ම ඊනියා සාම ක්‍රියාදාමය හෙලා දකිමින් පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව "ජාතික ආරක්ෂාව" අනතුරේ හෙලා ඇතැයි චෝදනා කලා ය. ඇය. එම කඩතුරාව යොදා ගනිමින්, ආන්ඩුව බලයෙන් පහ කොට 2004 අප්‍රේල් මස අලුත් මැතිවරනයක් කැඳවූවා ය. ඇගේ ශ්‍රීලනිප, ජවිපෙ හා තවත් පක්ෂ සමග සන්ධානයකින් එම මැතිවරනයෙන් යන්තම් ජය ලැබී ය.

කෙසේ වෙතත්, බලයට පැමිනීමෙන් පසුව. කුමාරතුංග සාම සාකච්ඡා යලි අරඹන ලෙස ප්‍රධාන ලෝක බලවතුන්ගෙන් හා මහ ව්‍යාපාරිකයන් අතර බලගතුම කොටස් වෙතින් එල්ල වූ පීඩනයට ක්ෂනිකව ම ලක් විය. දශක දෙකක සිවිල් යුද්ධයට පසුව, කොලඹ සංගත නායකයන්ට හා විදේශ ආයෝජකයන්ට අවශ්‍යව ඇත්තේ, ආර්ථික ප්‍රතිව්‍යුහකරනය හා වඩා පුලුල් ලාභ අවස්ථා සඳහා මාවත සකසන ආකාරයේ සාකච්ඡාමය සාම ගිවිසුමක් එල්ටීටීඊය සමග ඇති කර ගැනීමයි. ජනාධිපතිනිය සාම ක්‍රියාදාමය යලි ඇරඹීමේ අස්ථිර ප්‍රයත්නයක යෙදුනු අතර එය ඇගේ වර්ගවාදී සගයන්ගේ විරුද්ධත්වය අවුලුවාලීමට තුඩු දී ඇත.

ආන්ඩුව හා එල්ටීටීඊය අතර ඒකාබද්ධ යාන්ත්‍රනයක් අරබයා පවත්නා දේශපාලන ගැටුම් පැන නැග ඇත්තේ, ආන්ඩුවේ ආර්ථික වැඩපිලිවෙල ද සුනාමියෙන් විපතට පත් දස දහස් සංඛ්‍යාත ජනයාට සැලකිය යුතු මට්ටමේ සහන සැපයීමට ආන්ඩුව අපොහොසත් වීම ද මගින් තව දුරටත් අවුලුවනු ලැබ ඇති තියුනු වන සමාජ ආතතීන් මධ්‍යයේ ය. අර්බුද සමයන්හි දී, ශ්‍රී ලංකාවේ ධනේශ්වරය, කම්කරු පන්තිය භේද කොට සිය බංකොලොත් පාලනයට එරෙහිව ඒකාබද්ධ අරගලයක් පැන නැගීම වලක්වාලනු පිනිස වර්ගවාදී ගැටුම්වලට නැවත නැවතත් උඩගෙඩි දී ඇත.

සිවරාම් ඝාතනය හා "ථෙරපුත්තාභය බලකායේ" නිවේදනය, පාලක ප්‍රභූව සහ එහි දේශපාලන ඒජන්තයන්, යලිත් වරක් අතිශයින් ම ක්ෂමාවිරහිත හා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම යොදා ගැනීමට පසුබට නොවනු ඇති බවට, වැඩ කරන ජනතාව වෙත කෙරුනු තියුනු අනතුරු ඇඟවීම් ය.

© www.wsws.org